# සී/ස යූබී ෆිනෑන්ස් සමාගම

- අර්නස්ට් ඇන්ඩ් යංග් විගණන ආයතනය විසින් 2022/23 වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන වාර්තාවේ සිංහල පරිවර්තනය පහත දැක්වේ.
- මෙහි භාෂා අතර යම් අනනුකූලතාවයක් (වෙනසක්) ඇති වුවහොත් ඉංග්‍රීසි බසින් පලකළ වාර්තාව බලපැවැත්වේ.

**ස්වාධීන විගණකගේ වාර්තාව**
**සීමාසහිත යූබී ෆිනෑන්ස් සමාගමේ කොටස් හිමියන් වෙත**

**මූල්‍ය ප්‍රකාශනවල විගණනය පිළිබඳ වාර්තාව**

EY
Building a better working world
APAG/ WDPL/MSK/DRM

Ernst & Young
Chartered Accountants
201, De Saram Place
P.O. Box 101
Colombo 10, Sri Lanka

Tel : +94 11 246 3500
Fax (Gen): +94 11 269 7369
Fax (Tax) : +94 11 557 8180
Email : eysl@lk.ey.com
ey.com

**මතය**

අප විසින් 2023 මාර්තු 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හා අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් ඇතුළුව මූල්‍ය ප්‍රකාශන වලින් සමන්විත සීමාසහිත යූබී ෆිනෑන්ස් සමාගමෙහි ("සමාගම") හි මූල්‍ය ප්‍රකාශන විගණනය කර ඇත.

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත් සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල බවත් අපගේ මතය වේ.

**මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට ( SLAuSs ) අනුකූලව අපගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ වූ අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආචාරධර්ම සංග්‍රහයට අනුකූලව අපි සමාගමෙන් ස්වාධීන වන අතර ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව අපගේ අනෙකුත් ආචාර ධර්ම වගකීම් ඉටු කර ඇත. අප ලබාගෙන ඇති විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු බව අපි විශ්වාස කරන්නෙමු.

**මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ලබා දෙන මූල්‍ය ප්‍රකාශන සැකසීම සඳහා කළමනාකරණය වගකිව යුතු අතර, ප්‍රමාණාත්මක වංචා හෝ වැරදි හේතුවෙන් විය හැකි සාවද්‍ය ප්‍රකාශනවලින් තොර මූල්‍ය ප්‍රකාශන සැකසීමට හැකි වනු පිණිස අවශ්‍යයයි කළමණාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයන් සඳහා කළමණාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ සමාගමේ හැකියාව තක්සේරු කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

**මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්**

මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයෙන් තොරද, වංචාවක් හෝ දෝෂයක් නිසාද යන්න පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා ගැනීම සහ අපගේ මතය ඇතුළත් විගණක වාර්තාවක් නිකුත් කිරීම අපගේ අරමුණ වේ. සාධාරණ සහතිකයක් යනු ඉහළ මට්ටමේ සහතිකයක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට අනුකූලව සිදුකරනු ලබන විගණනයක් පවතින විට එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරන බවට සහතිකයක් නොවේ. සාවද්‍ය ප්‍රකාශයන් වංචාවකින් හෝ දෝෂයකින් මතු විය හැකි අතර, තනි තනිව හෝ සමස්තයක් වශයෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ගනු ලබන පරිශීලකයන්ගේ ආර්ථික තීරණ කෙරෙහි සාධාරණ ලෙස බලපෑම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට අනුකූලව විගණනයක කොටසක් ලෙස, අපි වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කරන අතර විගණනය තුල වෘත්තීය සැක මුසු බව පවත්වා ගනිමු. අපිත්:

- වංචාවක් හෝ දෝෂයක් හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ අවදානම හඳුනාගෙන තක්සේරු කිරීම, එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ අපගේ මතයට පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම. වංචාවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් අනාවරණය කර නොගැනීමේ අවදානම, දෝෂයක් නිසා ඇතිවන ප්‍රතිඵලයකට වඩා වැඩිය, මන්ද වංචාවට කුමන්ත්‍රණ, ව්‍යාජ, චේතනාන්විත අතපසුවීම්, වැරදි නිරූපණයන් හෝ අභ්‍යන්තර පාලනය මඟහැරීම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අපි අදහස් නොකරමු.

- භාවිතා කරන ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම් ඇස්තමේන්තු සහ අදාළ හෙළිදරව් කිරීම් වල සාධාරණ බව ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට අපි නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට අපගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් අපගේ මතය විකරණය කළ යුතුය. අපගේ නිගමනයන් අපගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර එයට පාදක වූ සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල අතුලත් බව අගයන ලදී.

අපගේ විගණනයේදී අප හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ කිසියම් සැලකිය යුතු දුර්වලතා ඇතුළුව, විගණනයේ සැලසුම්ගත විෂය පථය සහ කාලසීමාව සහ සැලකිය යුතු විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනයට සම්බන්ධ අය සමඟ අපි සන්නිවේදනය කළෙමු.

**වෙනත් නීතිමය සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියට අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් අප විසින් ලබාගෙන ඇති අතර, අපගේ පරීක්ෂණයෙන් පෙනෙන පරිදි, සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇත.

(අත්සන් කළේ)
අර්නස්ට් ඇන්ඩ් යංග්
2023 ජූනි 28
කොළඹ

## 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා

### 2023 /03 /31 කාලසීමාව අවසානයේ මූල්‍ය සමාගමෙහි ප්‍රධාන මූල්‍ය දත්ත (විගණනය කරන ලද)

| **රුපියල් මිලියන** | **වර්තමාන කාල පරිච්ඡේදය 2022 / 04 / 01 සිට 2023 / 03 / 31 දක්වා** | **වර්තමාන කාල පරිච්ඡේදය 2021 / 04 / 01 සිට 2022 / 03 / 31 දක්වා** |
|---|---|---|
| පොලී ආදායම | 2,013.4 | 1,522.3 |
| පොලී වියදම | (1,274.4) | (679.0) |
| **ශුද්ධ පොලී ආදායම** | **739.0** | **843.3** |
| වෙළඳ කටයුතු වලින් ලද ලාභය / (අලාභය) | 20.8 | 23.2 |
| වෙනත් ආදායම් | 92.5 | 102.8 |
| මෙහෙයුම් වියදම් (හානිකරණ රහිත) | (593.4) | (480.6) |
| හානිකරණය | (332.7) | (264.1) |
| බදු පෙර ලාභය/(අලාභය) | **(73.8)** | **224.6** |
| *බදු* | (39.7) | (143.5) |
| බදු පසු ලාභය/(අලාභය) | **(113.5)** | **81.1** |

වක්‍ර බදු (මූල්‍ය සේවා සඳහා වැට් බදු හා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද) සහ සෘජු බදු (ආයතනික ආදායම් බදු)

### 2023 /03 /31 දිනට ප්‍රධාන මූල්‍ය දත්තයන් (විගණනය කරන ලද)

| **රුපියල් මිලියන වලින්** | 2023 / 03 / 31 දිනට | 2022 / 03 / 31 දිනට |
|---|---|---|
| **වත්කම්** | | |
| මුදල් හා බැංකුවල ඇති තැන්පතු | 510.3 | 232.4 |
| රජයේ සුරැකුම්පත් | 848.1 | 646.6 |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු | - | - |
| ණය (සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ණය හැර) | 8,088.9 | 8,632.7 |
| හිමිකම් ප්‍රාග්ධන ආයෝජන | 21.9 | 21.7 |
| ආයෝජන දේපල සහ දේපල වෙළඳාම් | 75.5 | 89.1 |
| දේපල, පිරියත හා උපකරණ | 333.4 | 240.5 |
| වෙනත් වත්කම් | 228.4 | 219.8 |
| **මුළු වත්කම්** | **10,106.5** | **10,082.8** |
| **වගකීම්** | | |
| බැංකුවලට ගෙවිය යුතු | 15.4 | 84.0 |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු | 300.2 | 701.0 |
| ගනුදෙනුකරුවන්ගේ තැන්පතු | 6,509.0 | 4,892.1 |
| වෙනත් ණය ගැනීම් | 180.9 | 1,236.8 |
| වෙනත් බැරකම් | 406.3 | 357.6 |
| **මුළු වගකීම්** | **7,411.8** | **7,271.5** |
| **හිමිකම්** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 3,016.5 | 3,016.5 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 72.0 | 72.0 |
| රඳවාගත් ඉපැයුම් | (551.8) | (342.6) |
| නියාමන පාඩු දීමනා සංචිතය | 92.5 | - |
| වෙනත් සංචිත | 65.5 | 65.4 |
| **මුළු හිමිකම්** | **2,694.7** | **2,811.3** |
| **මුළු හිමිකම් හා වගකීම්** | **10,106.5** | **10,082.8** |
| **කොටසකට ශුද්ධ වත්කම්** | **1.00** | **1.04** |

### 2023 /03 /31 දිනට ප්‍රධාන කාර්ය සාධන දර්ශක

| **අයිතමය** | 2023 / 03 / 31 දිනට | | 2022 / 03 / 31 දිනට | |
|---|---|---|---|---|
| **නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය (%)** | තථ්‍ය | අවශ්‍ය | තථ්‍ය | අවශ්‍ය |
| 1 වන ස්ථරයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | 31.1% | 8.5% | 29.4% | 7.0% |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය | 31.1% | 12.5% | 29.4% | 11.0% |
| අරමුදල් ප්‍රාග්ධනයට තැන්පතු වගකීම් අනුපාතය | 39.0% | 10.0% | 56.5% | 10.0% |
| **ණය කලඹේ ගුණාත්මකතාවය (%)** | | | | |
| දළ අක්‍රීය ණය අනුපාතය** | 28.7% | | 12.4% | |
| ශුද්ධ අක්‍රීය ණය අනුපාතය** | 18.3% | | 4.8% | |
| ශුද්ධ අක්‍රීය ණයට මූලික ප්‍රාග්ධන අනුපාතය** | 69.2% | | 17.4% | |
| (**අක්‍රිය ණය වර්ගීකරණය 2021/22 වර්ෂය හා සැසදීමේදී 2022/23 වර්ෂයේදී දින 180 සිට දින 120 දක්වා වෙනස් වීමට භාජනය වී ඇත) | | | | |
| වෙන් කිරීම් ආවරණ අනුපාතය | 36.2% | | 60.9% | |
| **ලාභදායීත්වය (%)** | | | | |
| ශුද්ධ පොලි ආන්තිකය | 7.1% | | 9.8% | |
| වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර) | -0.7% | | 2.2% | |
| හිමිකම් මත ප්‍රතිලාභ (බදු පසු) | -4.2% | | 2.9% | |
| ආදායම් මත පිරිවැය අනුපාතය | 69.6% | | 49.6% | |
| **ද්‍රවශීලතාවය (%)** | | | | |
| පවතින ද්‍රවශීල වත්කම්වලට ද්‍රවශීල වත්කම් අවශ්‍යතා අනුපාතය (අවම 100%) | 196.4% | | 165.6% | |
| ද්‍රවශීල වත්කම් වලට බාහිර අරමුදල් අනුපාතය | 18.3% | | 12.2% | |
| **නාමික තොරතුරු** | | | | |
| ශාඛා ගණන | 17 | | 17 | |
| බාහිර ණය ශ්‍රේණිය | " BB(lka) " - RWN (Fitch) | | [SL] BB (Positive) (ICRA) | |
| **නියාමන අධිකාරියක් විසින් පසුගිය මාස 6 තුල පනවා ඇති දඩ** | | | | |
| ප්‍රමාණය (රුපියල් මිලියන) | - | | - | |
| **නියාමන තැන්පතු මත සීමා පැනවීම්** | | | | |
| මුළු තැන්පතු සඳහා උපරිම සීමාව (රු. මිලියන) | - | | - | |
| **නියාමන ණයදීම් මත සීමා පැනවීම්** | | | | |
| මුළු ණය කළඹ සඳහා උපරිම සීමාව (රුපියල් මිලියන) | - | | - | |

**සහතික කිරීම:**

යූබී ෆිනෑන්ස් සමාගමෙහි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍යය සාමාන්‍යාධිකාරී - මූල්‍ය සහ අනුකූලතා නිලධාරී වන අප විසින් සාමුහිකව පහතින් සහතික කර ඇති පරිදි,

(අ) ඉහත ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති ආකෘතියට හා අර්ථ දැක්වීම් වලට අනුකූලව සකස් කර ඇත.

(ආ) බලපත්‍රලාභී මූල්‍ය සමාගම විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශනවල අන්තර්ගත තොරතුරු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවල උද්ධෘතයක් ලෙස සලකණු ලැබේ.

(අත්සන)
රන්සිත් කරුණාරත්න
අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී

(අත්සන)
අසංක උඩුගම
නියෝජ්‍යය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

(අත්සන)
රමේෂ් ෆොන්සේකා
අංශ ප්‍රධානී - අනුකූලතා

2023 ජූනි 28 කොළඹදී